# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශෙෂ

අංක 1758/34 - 2012 මැයි මස 18 වැනි සිකුරාදා - 2012.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී-බී 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වැනි වගන්තිය යටතේ වූ නියමය

කලින් කළ සංශෝධිත පරිදි 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වැනි වගන්තිය සමඟ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු ඉහත කී පනතේ 72 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දොළහක් වූ මැයි මස 18 වැනි දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මෙම නියමය මඟින් පවරා දෙමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 මැයි මස 18 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලබඩ කෝරලයේ, ගලබඩ පත්තුවේ, මෝදර තැන්නේ පිහිටි "විසින්ගේ වත්ත" ද, ඊට යාබද "විසින්ගේ හේනේ " දකුණු කැබැල්ල ද, "විසින්ගේ ගෙදර ගාව වත්ත" ද, විසින්ගේ වත්ත හෙවත් ඊට යාබද වත්ත ද, විසින්ගේ ගෙදර ගාව වත්ත ද, පුලිගුරාළගේ වත්ත ද, පල්ලේගේ වත්ත ද යන ඒකාබද්ධ නොබෙදූ ඉඩම උතුරට, මෙම ඉඩමත්, උක්කු බණ්ඩාගේ ඉඩමත් වෙන් වන එඬරු වැට සහ පල්ලේහේනේ තොටිල්ල ගහ ද, නැගෙනහිරට : එම්. කෙයිට් මිනින්දෝරු තැන විසින් මැන සාදා ඇති වර්ෂ 1917.07.03 දින දරන පිඹුරෙහි සඳහන් අංක 1 දරන බිම් කැබැල්ල වෙන් වන ගල්හිරිය ද, දකුණට : මහ ඔය ද, බස්නාහිරට : මෝදර තැන්නේ කුඹුර සහ අගල ද යන මායිම් තුළ පිහිටි අක්කර නමයයි රූඩ් තුනයි පර්චස් දාහතරක (අ. 9, රූ. 3, පර්. 14) විශාලත්වය ඇති බිම් කොටස සහ ඊට අයත් සියලු දේ ද වේ.

අක්කර 1ක් වූ එකී නොබෙදූ ඉඩම කෑගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 581/279 වැනි පත්ඉරුවේ ලියාපදිංචි වී ඇත.

06 - 449/1

1A - G 016090 — 435 (2012/05)

එල්.ඩී-බී 9/2011.

**1963 අංක 11 දරන මුදල් පනත**

72 වැනි වගන්තිය යටතේ වූ නියමය

කලින් කළ සංශෝධිත පරිදි 1963 අංක 11 දරන මුදල් පනතේ 71 වැනි වගන්තිය සමඟ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ කියවිය යුතු ඉහත කී පනතේ 72 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දොළහක් වූ මැයි මස 18 වැනි දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මෙම නියමය මගින් පවරා දෙමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති.

2012 මැයි මස 18 වැනි දින,
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

*උපලේඛනය*

1. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, ත්‍රිකුණාමලය නගරයේ, ඩයික් වීදියේ, කොට්ඨාස අංක 3හි අංක 326 දරන ස්ථානයේ පිහිටි ඉඩම් කැබැල්ල සහ ඊට අයත් පොල්වගාව සහ වෙනත් වගාවන් ද, ඒ හා සම්බන්ධ අන් සියලු අයිතිවාසිකම් ද ඇතුළුව නැගෙනහිරට : මුහුදු වෙරළ ද, දකුණට : එළගුනාදන් මුරුගප්පාට අයත් නිවස සහ ඉඩම ද, බස්නාහිරට : මහා මාර්ගය ද, උතුරට : නැසී ගිය සිත්තම්පලම් නල්ලතම්බිට අයත් නිවස සහ ඉඩම ද යන මායිම් තුළ පිහිටියා වූ ද, බලයලත් මිනින්දෝරු ආර්. මුරුගුපිල්ලෙයි විසින් මැන සාදන ලද 1963 ජූලි මස 14 වැනි දිනැති අංක 626 දරන පිඹුරෙහි කැබලි අංක "ඒ " ලෙස දක්වා ඇති, උතුරට : ආර්. සහාරත්නම් මහත්මියට අයත් දේපළ ද, නැගෙනහිරට : මුහුදු වෙරළ ද, දකුණට : එස්. නඩරාජාට අයත් දේපළ ද, බස්නාහිරට : ඩයික් වීදිය ද, යන මායිම් තුළ පිහිටි, පර්චස් දහයයි දශම දෙකයි පහක (අ. 0, රූ. 0, පර්. 10.25) විශාලත්වයෙන් යුක්ත වූ බිම් කොටස වේ.

මෙම ඉඩම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 38/169 දරන පත්ඉරුවෙහි ලියාපදිංචි වී ඇත.

2. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ ත්‍රිකුණාමල වීදියේ පිහිටි, ජේ. ටී. ඩේවිඩ් බලයලත් මිනින්දෝරු තැන විසින් 1952 මැයි මස 24 වැනි දින සලකුණු කර සහ සහතික කර මහනුවර දිසා අධිකරණයේ අංක පී. 1530 දරන නඩුවට ගොනු කරන ලද පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 4.7) විශාලත්වයෙන් යුත් බෙදා වෙන් කරන ලද නිරිතදිග කැබැල්ල සහ එහි තුළ පිහිටි පැරණි වරිපනම් අංක 273, 273ඒ, 273බී සහ 273 සී දරන සහ දැනට අංක 245, 245/1, 245/2 සහ 245/3 දරන ගොඩනැගිලි සහ ඉහත කී බිම් කොටසට මායිම් ඊසාන දෙසට : මෙම ඉඩමේ ඉතිරි කොටස වන අංක 1 දරන කැබැල්ල ද, ගිණිකොන දෙසට : වල්ලිඅම්මාට අයත් ව තිබුණු සහ දැනට එම්. සී. ඒ. රහීම්ට අයත් ඉඩම ද, නිරිත දෙසට : අස්ගිරිය විහාරයට අයත් ඉඩම ද, වයඹ දෙසට : පිකුට්ටි ලෙබ්බේ සින්නතම්බිට අයත් ව තිබුණු සහ දැනට මහ නගර සභාවට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි, ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම හතක (අ. 0, රූ. 0, පර්. 4.7) විශාලත්වයෙන් යුත් බෙදා වෙන් කරන ලද එකී ඉඩම සහ එහි තුළ පිහිටි ඉහත කී සියලු ගොඩනැගිලි ද සමග කැබලි අංක 01හි වයඹ දිග මායිම දිගේ අඩි 3ක් පළලැති, ප්‍රධාන පාරට යාමට ඒමට ඇති පාරේ මාර්ග අයිතිය ද සහ එහි දැනට ඉදි කෙරෙමින් පවතින ගොඩනැගිල්ල ද වේ.

ඉහත කී කැබලි අංක 2 දරන ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඒ 91/116 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති, ප්‍රමාණයෙන් පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) වූ ඉඩමෙන් බෙදා වෙන් කරන ලද කැබැල්ලක් වේ.

06 - 449/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.